**සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම** - 2016

----------------------------------------------------------------

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික)සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

------------------------------

(අ) දේපළ, පිරියත හා උපකරණවලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ සවිස්තරාත්මක උපලේඛන නොමැතිවීම හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.13,435,435 ක වටිනා දේපළ පිරියත හා උපකරණවල තක්සේරුව, නිරවද්‍යතාව හා පරිපූර්ණත්වය සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. තවද, දේපළ පිරියත හා උපකරණ පිළිබද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 16 මගින් දක්වා ඇති අනාවරණය කිරීමේ අවශ්‍යතාවට අනුකූලව, දේපළ, පිරියත හා උපකරණ ක්ෂයකිරීම පිළිබද සමාගම විසින් අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාගම විසින් 2016 දෙසැම්බර් 31 දින භාණ්ඩ පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.15,493,432 ක් වටිනා භාණ්ඩවල තක්සේරුව, නිරවද්‍යතාව හා පරිපූර්ණත්වය සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. තවද, භාණ්ඩ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය-LKAS 2 අනුකූලව, නිකුත් නොවී ඇති භාණ්ඩවල පාඩු හඳුනා ගැනීමටද සමාගම අසමත් වී තිබුණි.

(ඇ) ග්‍රේට්වෝල් බස් ව්‍යාපෘතිය සඳහා 1993 වර්ෂයේදී රු.12,970,875 ක් වටිනා භාණ්ඩ සමාගම වෙත ලැබී තිබුණි. කෙසේ වුවද, එම භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දිනට මෙම භාණ්ඩවල පැවැත්ම හා ඒවායේ තක්සේරුව පිළිබඳ භාණ්ඩ ලේඛන තක්සේරු වාර්තා හෝ ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා දීමටද සමාගම අසමත් වී තිබුණි.

(ඇ) පරිපාලන වියදමට එදිරිව උපචිත වියදම් හා වෙනත් ගෙවිය යුතු මුදල්, ආපනශාලා තැන්පතු, ආපසු එවූ චෙක්පත් හා වෙළඳ ණයහිමියන් සඳහා වන අනුපිළිවෙළින් රු.13,594,667, රු.10,000 , රු.276,692 හා රු.306,317 ක් සමාගම විසින් ලියා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලන වියදම රු.14,187,676 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මෙම සමාගම ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීම සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම යන ඡේදයේ විස්තර කරන ලද කරුණුවල වැදගත්කම හේතුකොටගෙන විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) ඉහත දක්වා ඇති පරිදි, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන නොමැති බවත්, සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා නොමැති බවත් මා දරන්නාවූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1833 කර්මාන්තශාලා ආඥාපනතින් සංශෝධිත 2000 කර්මාන්ත ශාලා පනත | |
| (i) 12 (1) වගන්තිය | පනතට අනුව කර්මාන්තශාලා ගොඩනැගිලි පිරිසිදු වාතාශ්‍රය ලැබෙන අයුරින් නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) 13(1) වගන්තිය | කර්මාන්තශාලාව තුල පවිත්‍රතාව, උෂ්ණත්වය, වාතාශ්‍රය හා ආලෝකය සඳහන් අයුරින් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 42 (අ) (1) වගන්තිය | ගිනි නිවන උපකරණ සවිකිරීම හා ගොඩනැගිලි හා සේවක රක්ෂණ ලබා ගැනීම සිදු කර නොතිබුණි. |
| (iv) 50 වගන්තිය | ගිලන්රථ, වෛද්‍ය ඒකක හෝ වෛද්‍ය පහසුකම් සපයා නොතිබුණි. |
| (v) 53(1) වගන්තිය | කර්මාන්තශාලා සේවකයින්ගේ ඇස් සඳහා ආරක්ෂිත උපකරණ හා සෞඛ්‍ය ආරක්ෂාව සලසා නොතිබුණි. |
| (ආ) 1988 අංක. 56 සහ 2000 අංක. 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතේ 23 (අ) වගන්තිය | කර්මාන්තය පවත්වා ගැනීම සඳහා බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 170(1) වගන්තිය | සමාගම් පනත අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කල යුතු වාර්ෂික වාර්තාව (පෝරම අංක 15) ඉදිරිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,085,866 ක අතිරික්තයක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.408 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,085,458 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයෙහි බස් රථ අලුත්වැඩියා ආදායම රු.38,691,555 කින් වර්ධනය වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යයසාධනය**

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම ආරම්භ කිරීමේදී සමාගම විසින් සිදුකල යුතු කාර්යභාරයන් ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ අඩු වියදමකින්, උසස් ප්‍රමිතියකින් සම්පූර්ණයෙන් සහ අර්ධ වශයෙන් අලුත්වැඩියාව, ආසන කවර සහ ආසන සඳහා කුෂන් පිළියෙල කිරීම සහ ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල වාහන අලුත්වැඩියා කිරීම යන කාර්යභාරයන් හඳුනාගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම අනුව වර්ෂයේ කාර්තු 04 සඳහා බස් රථ 84 ක් අලුත්වැඩියා කල යුතු වුවත්, බස් රථ 69 ක් පමණක් අලුත්වැඩියා කර තිබුණි. ඒ අනුව වර්ෂය තුලදී අලුත්වැඩියා කිරීමට සැලසුම් කළ බස් රථ සංඛ්‍යාවෙන් සියයට 82 ක් පමණක් ඉටුකර තිබුණි.

(ආ) ඩිපෝවලින් සමාගම වෙත බස් රථ භාරදීමෙන් පසු අලුත්වැඩියාව සඳහා ඉංජිනේරු අංශය වෙත යැවීමේදී දින 05 සිට දින 417 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණද, අලුත්වැඩියා ආරම්භ කිරීමට පෙර මෙතරම් දීර්ඝ කාලයක් තබා ගැනීමට හේතු විගණනයට අනාවරණය නොවීය.

(ඇ) බස් රථ සම්පූර්ණ අළුත්වැඩියා කිරීම හා අර්ධ වශයෙන් අබලන් වූ රථ අළුත්වැඩියා සිදු කළද, එක් එක් අවස්ථාවන් අනුව සිදු කරනු ලැබුවද, ඒ සඳහා පැහැදිලි ප්‍රමිතිගත ඇස්තමේන්තු සකස් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඈ) ඇස්තමේන්තු සැකසීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා අමුද්‍රව්‍ය අවශ්‍යතාවයන් නිසි පරිදි හඳුනාගෙන තොග පාලන ක්‍රමයක් සහිතව මිලදී ගැනීම සිදු කරන බවක් නිරීක්ෂණය නොවීය.

(ඉ) සමාගම නිශ්චිත ක්‍රමවේදයකින් තොරව අළුත්වැඩියා කටයුතු සඳහා ශ්‍රමය කොන්ත්‍රාත් පදනමින් ලබාගෙන තිබුණු අතර, අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ සමාගම මඟින් ලබාදී ශ්‍රමය සඳහා පමණක් ගෙවීම් කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් සමඟ වර්ෂයක කාලයකට ගිවිසුම්ගතවී තිබුණද, එම කාර්ය නියමිත පරිදි ඉටු නොකිරීම මත ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳ ගිවිසුමේ කොන්දේසි මගින් ආවරණය කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සේවක දිරිදීමනා ලෙස රු.3,129,352 ක් ගෙවීම් කර තිබුණද, දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ වෙනත් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) සමාගම විසින් තම ව්‍යාපාර කටයුතු ඒකළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අක්කර 23 ක් පමණ විශාල වූ ඉඩමෙන් කොටසක පවත්වා ගෙන ගියද, එම ඉඩම් කොටසේ නීතිමය අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,476,369 ක් වැයකර තිබුණු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් අනුගමනය කිරීමකින් තොරව ප්‍රසම්පාදන නිලධාරි පෞද්ගලිකව ආයතන 03 කින් ලබාගත් මිල ගණන් පදනම් කරගෙන මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) බස් රථ බොඩි අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් තොග වශයෙන් මිලදී ගැනීමට හැකියාව තිබියදී අමතර කොටස් අවශ්‍යවන අවස්ථාවේදී ඒකක ලෙස මිලදී ගැනීම නිසා තොග වශයෙන් මිලදී ගැනීමෙන් ලබාගත හැකිව තිබූ ආර්ථික වාසි (වට්ටම්) අහිමි වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ තනතුරු 30 ක් වෙනුවෙන් 121 ක කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ තථ්‍ය කාර්ය මණ්ඩලය 65 දෙනෙකු වූයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් 56 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු අතර සමාගමේ අනුමත ප්‍රධාන තනතුරු වන සාමාන්‍යාධිකාරී, පරිපාලන නිලධාරි, ගිණුම් නිලධාරි, කර්මාන්ත ශාලා ඉංජිනේරු හා අභ්‍යන්තර විගණන නිලධාරි යන තනතුරු සඳහා නිලධාරින් පත්කර නොතිබුණි. සමාගම පරිපාලන නිලධාරි හා ගිණුම් නිලධාරි තනතුරු සඳහා වැඩ ආවරණය කිරීමේ පදනම මත නිලධාරින් පත්කර තිබුණි. මේ අනුව ආයතනයෙහි ප්‍රධාන තනතුරු සඳහා නිලධාරින් පත් නොකිරීම ආයතනයේ කටයුතු නිසි පරිදි සිදුකිරීමට බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය

සමාගම 2001 ඔක්තෝබර් 01 දින රජය සතු සමාගමක් ලෙස ස්ථාපනය කර තිබුණු අතර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 අගෝස්තු 15 දින ලියාපදිංචි කර තිබුණි. සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු.10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 650,000 කින් යුක්ත වූ අතර එයින් කොටස් 2 ක් පමණක් නිකුත් කර තිබුණි. එම කොටස් දෙක මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් මිලදී ගෙන තිබුණි.

## 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක:පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසරකුත් මාස 05 ක් ප්‍රමාද වී එනම් 2018 සැප්තැම්බර් 25 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.3 ක්‍රියාකාරි සැලැස්ම

2003 ජුනි 02 දිනැති හා අංක:පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

සමාගමේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් සථාපිත කර නොතිබුණි.

## 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් 4.2.1 (අ) ඡේදය ප්‍රකාරව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම හා ස්ථාවර වත්කම් වාර්ෂිකව භෞතිකව සත්‍යාපනය නොකිරීම |
| (ආ) තොග පාලනය | වාර්ෂිකව තොග සමීක්ෂණ සිදු නොකිරීම. |